---

ගිරිබාව ප්‍රාදේශිය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 09 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, ගිරිබාව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ගිරිබාව ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබූ අතර, 2011 දෙසැම්බර් සිට 2012 ජූනි දක්වා කාලය සඳහා 2012 වර්ෂයේදී ලද රු.287,605 ක මුද්දර ගාස්තු ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ආ). ලැබිය යුතු රු.36,509,966 ක කර්මාන්ත ණය ගැති වටිනාකම මූලධන ආධාර ගිණුම බැරකර ණය ගැති ගිණුම හරකර තිබියදී, නැවත වතාවක් ණයගැති ගිණුම් හරකර වෙනත් ආධාර ගිණුමට බැර කිරීමෙන් වර්ෂයේ අතිරික්තය හා හිඟ හිටි වෙනත් ආදායම් රු.36,509,966 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඇ). 2010 වර්ෂයේ ඉටුකල කර්මාන්ත සඳහා රු.649,855 ක් හා 2011 වර්ෂයේ ඉටුකල කර්මාන්ත සඳහා රු.18,628,800 ක් වශයෙන් ප්‍රවර්ථන වර්ෂයේ ලද රු.19,278,655 ක් මූලධන ආධාර ලෙස ගිණුම් ගත කිරීම මත අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු41,373,839 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,083,976 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,183,403 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). අයවැයගත ශුද්ධ ප්‍රතිපාදනය රු.18,926,000 ක් වුවද, සත්‍ය වියදම රු.67,899,000 ක් වූයෙන් රු.48,973,000 ක ඉක්මවීම් පැවති අතර, ඒ සම්බන්ධ පරිපූරක මගින් අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන අනුමත කරගෙන නොතිබුණි.

(ආ). ඉකුත් වර්ෂ වලදී ණය හිමියන් අධි ප්‍රතිපදානය කිරීම මත ණය හිමියන් රු.3,874,125 ක් සමාලෝචිත වර්ෂය තුලදී අධිකතා හා ඌණතා ගිණුමට එරෙහිව කපා හැර තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, සත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, සත්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | සත්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 130 | 190 | - |
| (ii) | බදුකුලී | 1,725 | 2,205 | 681 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 135 | 169 | - |
| (iv) | වෙනත් ආදායම් | 13,944 | 13,843 | 2,332 |

#### 2.3.2 බදුකුලී

(අ) සභාව සතු අවම ලංසුව රු.160,050 ක් වූ දේපල දෙකක් 2011 හා 2012 වර්ෂයන්හිදී බදුදීමට නොහැකි වී තිබූ අතර 1990 සිට 2010 දක්වා කාලය තුල බදුදුන් දේපල 13 ක් වෙනුවෙන් රු.234,016 ක්ද 2011 වර්ෂයේ බදුදුන් දේපල 3 ක් වෙනුවෙන් රු.42,824 කද 2012 වර්ෂයේ බදු දුන් දේපල 03 ක් වෙනුවෙන් රු.182,232 කද හා ඊට අදාල දඩ මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකරගෙන නොතිබුණි.

(ආ) වාර්ෂික ටෙන්ඩර් මත බදුදීම් සඳහා වූ බදු ගිවිසුම ප්‍රකාරව, වාරික 4 කට සමාන මුදලක් 'ආරක්ෂිත ඇප ලෙස' ලබාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව බදුදී තිබූ දේපල 3 කට අදාලව ලබාගත යුතු ඇප මුදල රු.126,630 ක් අඩුවෙන් ලබාගෙන තිබුණි. ටෙන්ඩර් මත බදුදීම් යටතේ වූ බදු ගිවිසුමෙහි 03 හා 04 වගන්ති ප්‍රකාරව මාසයට අදාල වාරික බදු මුදල ඊළඟ මස 10 දිනට ප්‍රථම ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වන්නේ නම් 10% ක ප්‍රමාද ගාස්තුවක් අයකළ යුතු වුවද, ප්‍රමාද කාලයක් සඳහා රු.69,379 ක දඩ මුදලක් අයකරගෙන නොතිබුණි.

2.3.3 <u>දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැරි ගාස්තු</u>

සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත කර ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු පිළිබද සමීක්ෂණයක් සදුකර ගාස්තු අයකිරීමක් කෙරෙහි සභාවේ අවධානය යොමුව නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය තුල එක් කුළුණකින් සංවර්ධන ආධාර ලෙස රු.200,000 ක මුදලක් ලබාගෙන තැන්පතු ගිණුමට බැරකර තිබුණි.

2.3.4 <u>වාහන නවතා තැබීමේ ගාස්තු</u>

සභා බල ප්‍රදේශය තුල වාහන නැවැත්වීමට අදාලව අතුරු ව්‍යවස්ථාවක් පැවතියද ත්‍රීරෝද රථ නැවැත්වීමට අදාලව වාර්ෂිකව හෝ කාලානුරූපීව සමීක්ෂණයක් කර බල ප්‍රදේශය තුල පවතින ත්‍රීරෝද රථ ලියාපදිංචිය හෝ නැවතුම් ස්ථාන විධිමත් කිරීමක් සිදුව නොතිබුණි.

2.3.5 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු හදුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

2.4 <u>නිශ්ක්‍රීය භෞතික සම්පත්</u>

රු.151,000 ක් වටිනා ගැලුම් 800 ක ජල බවුසරයක් වසර පහක පමණ කාලයක සිට නිශ්ක්‍රීයව පැවතින.

2.5 <u>වත්කම් කළමනාකරණය</u>

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.4,177,750 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් 1988 ප්‍රාදේශීය සභා( මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති අංක 218 හි විධි විධාන ප්‍රකාරව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

2.6 <u>සභාව විසින් ආරම්භ කර ඇති නෛතික කරුණු</u>

සභාව විසින් දේපල බදුදීම් සම්බන්ධව අවස්ථා 8 කට අදාල රු.304,827 ක හිඟ කුලී සම්බන්ධයෙන් නඩු පවරා තිබූ අතර, ඉන් රු.12,488 ක හිඟ මුදල් අයකර අවසන් වී තිබුණි. රු.209,223 ක් හිඟව පැවති දේපල 03 ක් සම්බන්ධව මාසිකව රු.5,000 බැගින් අයකරමින් පැවති අතර වටිනාකම රු.83,116 ක් වූ දේපල 03 ක් සම්බන්ධව ප්‍රගතිය නඩු ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණෙන් හදුනාගත නොහැකි විය.

2.7 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

කාබනික පොහොර නිෂ්පාදනය සඳහා කසල කළමනාකරණ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා රු.50,000 ක මුදලක් වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල එහි කටයුතු ආරම්භ කර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය